4 වන පිටුවේ

ජනතාවගේ නිදහස කොටුවිය. තෙවනුව, මිනිස් අයිතිය අවතක්සේරු විය. සිව්වෙනුව අධිකරණය කර ඇඹිය. අවසානයේ මේ කුඩා දූපත නීති රිති රහිත මිලේච්ඡ රටක් ලෙස ජගත් මානව සංහතිය ඉදිරියේ තනි විය. නාමිකව රටට එරෙහිව සම්බන්ධක පැනවෙමින් තිබිණ. මහින්ද පාලනය පරාජය කිරීමට තරම් රටේ දේශපාලන පක්ෂ ශක්තිමත්ව නොතිබිණ. රට මහින්දගෙන් බේරා ගැනීමට සිවිල් ජනතාව පෙළ ගැසිණ. සාධාරණ සමාජයක් කරා ව්‍යාපාරය විසින් බල ගන්වන ලද්දේ එකී සිවිල් සමාජ ප්‍රවේගයයි.

වර්තමාන පාලනය, යහ පාලනය ලෙස හඳුන් වන්නේ මහින්ද පරාද කළේ නිර්දේශපාලන පෙරමුණක් විසින් නිසාය. යහ පාලනයට එක් අවුරුදු තුන් මසක් ගෙවුණ නැත, තමුසෙලා මොනවාද කෙරුවේ කියා ජනතාව අසති. ඊට හේතුව ජනවාරි ජයග්‍රහණයට පසුව සිවිල් සමාජය සහ පාලකයන් උනුන් දුරස්වීමය. එය රහසක් නොවේ. කළේ මොනවාදැයි කෑ ගසා ඇසිය යුතු බොහෝ කාරණා වෙති. මහින්ද ඉබ්බන්වලදී ඇසුවේ කළේ මොනවාද කියා නොවේ. මේ රට ගෙනියන්න තමුසෙලාට බැරි නම් මට දෙනවා. මං පෙන්නන්නං රටක් කරන්නේ කොහොමද කියලා. මේ ප්‍රකාශය කරන මහින්ද කවුද? ඔහු රටට දස වසරක් පුරා දුන් නායකත්වය කුමක්ද? යුධ ජයග්‍රහණය? එහිදී ඔහු විශිෂ්ඨ වෙති. එහෙත් යුධ ජයග්‍රහණයට මුවාවී මැදමුලන මහින්ද රටට කළේ කුමක්ද?

ප්‍රජාතන්ත්‍රවාදී රටවල මැතිවරණ වලදී ආණ්ඩු පරාජය වේ. එවිට ජනතාව පත් කරගත් නව පාලකයාට සුභ පතා බලය අහිමි පාලකයා ගෙදර යයි. එහෙත් ජනවාරි 9 වෙනිදා ලංකාවේ එය සිද්ධ වුණේ නැත. ඇදත් මහින්ද අහිමි බලය ඩැහැ ගැනීමට පන්සල වටේ යමින් සිටියි. ඒ 2010 ජනාධිපති අපේක්ෂක සරත් පොන්සේකාට කළ දේ 2015දී මහින්ද රාජපක්ෂට කිසිවෙකු නොකළ හෙයිනි. එහෙත් ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා කීවේ තමන් පැරදුණා නම් සිය පවුල පස් යට බවය. සරත් පොන්සේකාගේ ඉරණම මහින්දට අත් නොවුණේ ඔහු යුද්ධය දිනූ නිසා නොවේ. මහින්ද කළ තුට්ටු දෙකේ වැඩ යහ පාලනය අනුමත නොකරන නිසාය. මහින්ද සතීපෙන් ගෙදර ගියේ සිවිල් බලවේගයේ හැඳිච්චකම නිසා මිස, ඒකාබද්ධ විපක්ෂයේ හයියට නම් නොවේ.

මහින්ද රාජපක්ෂ 2007 පෙබරවාරි 09 දින මංගල සමරවීර තම ආණ්ඩුවෙන් නෙරපීය. ඉන්පසුව මංගල මාතර අධිකරණය නඩුවකට පටලැවිය. මංගල සමග සිටි, පාර්ලිමේන්තු මන්ත්‍රී ශ්‍රීපති සූරියාරච්චි 2007 මාර්තුවේ රිමාන්ඩ් කරවිය. ඒ රජයේ වාහනයක් සම්බන්ධව පොදු දේපල පනත යටතේය. 2008 පෙබරවාරි මස 09 වෙනිදා ශ්‍රීපති සැක කටයුතු අනතුරකින් ඝාතනය විය. ශ්‍රීපති රිමාන්ඩ් කළ සිද්ධිය පමණක් ගනිමු. මහින්ද දැන දැන රජයේ වාහන අසු ගණනක් පරිහරණය කළ සච්චි වාස් ගුණවර්ධන පොදු දේපල පනත යටතේ අත් අඩංගුවට ගැනිණ. එදා මහින්ද කතා කළේ යහ පාලන ආණ්ඩුව මනුෂ්‍ය ඝාතනයක් කළා වාගේය. යෝෂිත රිමාන්ඩ් කළ විට මහින්ද කඳුළු හැලුවේ ආසියාවේ අවාසනාවන්තම තාත්තා හැටියටය. ඝාතනයවූ රගර් ක්‍රීඩක තාපුදිත්ගේ එසේම වැල්ලවත්තෙන් පැහැර ගෙන ගොස් ක්‍රිකුණාමලේ කඳවුරේ රඳවා සිටි දරුවන්ගේ තාත්තාලා තාත්තාලා නොවේ. මහින්ද රට ඉල්ලන්නේ මෙවැනි අතීතයක් අමතක කරලාය.

එහෙත් මේ මහින්දටත් ජන පදනමක් ඇත. 2015 ජනවාරියේ ඔහුට පනස් හත් ලක්ෂයක් ඡන්දය ලැබිණ. අගෝස්තුවේ මෛත්‍රී මහින්ද එක්ව කළ සටනේදී ලැබුණේ ඡන්ද හතලිස් හත් ලක්ෂයකි. මාර්තු 17 වෙනිදා එකොළොස් දහසක් පැමිණි බව කියති. ඉබ්බන්වලට පැමිණි පිරිස හතලිස් පන් දහසක් වුවද එය බසස්මක් මිස නැග්මක් නොවේ. **ඊළඟ මැතිවරණය 2020 බව දැන දැන, රට ඉල්ලා පපුවට ගසා ගන්නා මහින්ද රාජපක්ෂ දෙස අනුකම්පාවෙන් දෑත් බැඳ බලා සිටිය හැකිය. එහෙත් කිසිවෙකු අනේ අපොයි නම් කිව යුතු නැත. ඒ ජන මතය විසින් පත් කළ ආණ්ඩුවකට වෛර කරන බැවින් පමණක් නොවේ. තම වැරදි හඳාගැනීමේ හෝ සිදුවූ වැරදි වලට ජන්දයෙන් පත්වූ පාලකයෙකු ලෙස සමාව ගැනීමේ හෝ සදාචාරයක් නැත්තෙකු හෙයිනි.**

මහින්ද කළ ප්‍රකාශයට පිළිතුරු දීම කළ යුත්තේ ආණ්ඩුව විසිනි. එහෙත් මහින්ද සහ ඒකාබද්ධ විපක්ෂයේ හැසිරීම යහ පාලන ආණ්ඩුව නිර්මානය කළ ජනතාවට කරන අගතියකි. මේ කතා කරන්නේ ඒ සිවිල් බලය වෙනුවෙනි. මහින්ද පරාද කිරීමට මුල්වූ හැට හතර ලක්ෂයක් ජනතාව තමන් කළ වරදක් ගැන මෙහිදී තැවෙන බව වර්තමාන පාලකයන් හෝ මහින්ද සහ අනුගාමිකයන් දන්නේ නැත. ඒ ජනදයට පසුදා අමුඩ ගස්වා හන්දි ගානේ සිටුවා මෛත්‍රිපාල සිරිසේනගේ පින්තූරයට වැන්දවීමට ක්‍රියා නොකිරීම ගැනය. මැතිවරණ ප්‍රතිපල ඇසූ මහින්ද ගෙදර ගියේ කැමැත්තෙන් නොවේ. ඔහු මැදමුලනට යන විට මහින්දගේ ගමේ අඑයෝ රැස්ව සිටියහ. එහි පැමිණි සිටි එකෙකු රටට ඇහෙන්නට කෑ ගසා කීවේ කුමක්ද?

''ඇයි ඔබතුමා අරෑ මරලා හරි බලය ගත්තේ නැත්තේ කියාය. ප්‍රජාතන්ත්‍රවාදී රටක ජනතා තීන්දුවක් දෙස මහින්ද ඕනෑය කියන මිනිසුන් බලන්නේ එසේය. මාධ්‍ය ඒ කතාව රටටම ප්‍රචාරය කළහ. එය බරපතල ප්‍රකාශයකි. ඒ ප්‍රකාශය කළේ ගිරුවා පත්තුවේ හේන් ගොවියෙකු විය හැකිය සිතූ බොහෝ දෙනා ඒ අවලම් කතාව අවඥාවෙන් බැහැර කර අමතක කර දැමූහ. ගිරුවා පත්තුව යනු මහින්ද සාඩම්බරයෙන් කියා සිටින පරිදි ඔහුගේ උපන් ගමවේ. ඒ ගිරුවාපත්තුව යනු මරණයේ බිම් කඩ යයි කෙනෙකු නොකියති. එහෙත් උක්කුවා බක්කුවා සක්කුවා සෙක්කුවා ආදි ලෙස ප්‍රකට බොහෝ පාතාලයන්ද, අපරාධ පරික්ෂණ හිලධාරීන්ට ගල් ගසා මරණවා කී ඩී.වී. උපුල් ද, දැරියන් 200ක් කෙළෙසා සාදයක් පැවැත්වූ ප්‍රාදේශීය සභාපති ද, තංගල්ලේදී විදේශීයෙකු මරා ඔහුගේ පෙම්වතිය දූෂණය කළ ප්‍රාදේශීය සභාපති ද, මහින්ද මෙන්ම මිනි මරණ බිම්කඩේ උපන් අය වෙති. එහි උනුන් මරා ගැනීම සාමාන්‍ය තත්වයකි.

පසුගිය ජනාධිපති මැතිවරණය අතර, ඡන්ද රැස්වීමකට වෙඩි තැබූ බව කියන ජුලම්පිටියේ අමරේ මහින්දගේ බඩ බැඳගත් මිතුරෙකි. මහින්ද ගෙදර ගොස් ටික කලකින් නාරාහේන්පිට අභයාරාමය මුලස්ථානය කර ගත්තේය. එක් දවසක මහින්දට ආදරය කළ කලා කරුවන් පිරිසක් අභයාරාමයේදී මහින්ද හමුවිය. **එහිදී ප්‍රකට ගායිකාවක වන නිලා වික්‍රමසිංහ නමැත්තිය හිරිකිතයක් නැතිව ''ඇයි ඔබතුමා අරෑ මරලා හරි බලය ගත්තේ නැත්තේ'' කියා විමසුවාය.** ගිරුවා පත්තුවට අනන්‍ය මිනිසුන් උකුණන් මකුණන් සේ මරා දමන චින්තනය නිලා වික්‍රමසිංහට අනුගත කළේ කවිද? ඇය උපන්නේ ගිරුවා පත්තුවේ හේනක නොවේ. ඇය පාසල් ගියේ ජුලම්පිටියේ අමරේ සමග හෝ ආම් පිනේ සමග නොවේ. මාස්ටර් සර් වැනි ගී හරහා මානව දයාව රටට බෙදා දුන් නිලා වික්‍රමසිංහගේ සුන්දර මනස විකෘති කාලේ මහින්ද රාජපක්ෂ හෝ ඔහු බෙදා දුන් මහින්ද චින්තනය විසිනි. ඔහු තම හැකියාව මේ රටට පෙන්වා හමාරය. දැන් ඇත්තේ පසිඳින් පවා පන පිටින් හම ගසා කන ගිරුවා පත්තුවට අනුගත මිනිමරු සංස්කෘතිය ශ්‍රී ලංකා මාතෘ භූමියෙන් අතුගා දැමීමේ මෙහෙයුමය. මහින්දට ආපසු රට දුන්නොත් ඒ ටික කරයිද?

යුද්ධය අතර, මිනිමරු ප්‍රභාකරන් මැරුම් කෑවේය. අපේ සෙබලුන් ප්‍රභාගේ මිනිය වට කොට සිටින වීඩියෝ දර්ශන අතර, අපේ සෙබලෙකු මැරෙණ ප්‍රභාගේ මුහුණේ වැසූ මැස්සෙකු ඉවත් කරනු දැක්වේ. එය විශිෂ්ඨ ක්‍රියාවකි. එය දෙස ජගත් ප්‍රජාව විස්මයෙන් බලා සිටියහ. ඉන් ප්‍රකාශ වුණේ හතුරාගේ මරණයට ගෞරව කරන හඳිච්චකමය. මේ බව හිටපු හමුදාපති දයා රත්නායක මාධ්‍ය සාකච්ඡාවකදී හෙළි කළේය. මේ සාකච්ඡාව අන්තර් ජාලයෙන් නැරඹිය හැකිය. හමුදාවේ විනය ගැන සහතිකයක් දෙමින් හිටපු හමුදාපති දයා රත්නායක ඒ විස්තර කළේ යුද්ධය ජයගත් අපේ කරුණ යුද සෙබළුන් සතුවූ මානව දයාවය. හතුරාට වුවද මියගිය පසුව ගෞරව කිරීමේ හැඳිච්චකමය. නිරායුධ ගම් වැසියන් මරා දැමූ ප්‍රභාකරන්ගේ මිනියේ වැසූ මැස්සා එළවන ඒ මනුස්සකම සිය ප්‍රති මල්ලව එලාර රජුට බුනුමින් කළ දුටු ගැමුණු රජුට ආවේනික උරුමයකි. චන්ද්‍රිකා බණ්ඩාරනායක 2015දී යාපනයේදී මිස්ටර් ප්‍රභාකරන් කීවා කියා යකා නැවූ මහින්ද රාජපක්ෂට වර්තමාන දුටු ගැමුණු විය නොහැකිය. ප්‍රභාකරන්ගේ මිනියේ වැසූ මැස්සා එළවූ සෙබලාට දුටු ගැමුණුගේ විශිෂ්ඨත්වය ගිමිය. ඒ සෙබලා මහින්ද රාජපක්ෂට වඩා හැඳිච්චකමෙන් විශිෂ්ටයෙකි. තම ප්‍රති මල්ලව සරත් පොන්සේකාට, ශ්‍රීපති සූරියාරච්චිට, මංගල සමරවීරට වෛර කළ මහින්ද දුටු ගැමුණුගේ පුනරාගමනය නම් නොවෙයි. ඒ සතුරාට ගරු කරන හැඳිච්චකම නැති නිසාය.

මිනිස් ඝාතම පිරුණ මානුෂික මෙහෙයුම 2009 මැයි මස 18 වෙනිදා නිමවිය. ඉන් පසුව, 2010දී අපේ හමුදා සොල්දාදුවන් ලවා මාධ්‍ය වේදි එක්නැලිගොඩ විනාස කළේ හිටපු හමුදාපති දයා රත්නායකද? ගිරුවාපත්තුවේ රාජපක්ෂලාද? නැවත මහින්දට රට භාර දීමට සටන් කරන ඒකාබද්ධ විපක්ෂය කියන්නේ ප්‍රදීප් එක්නැලිගොඩ මරා දැමුවේ කොටියෙකු නිසා බවය. තම උපන් භූමියේ ජලය විෂ මුසුවූ කම්හලකට එරෙහිව රතුපස්වල ජනතාව උද්ඝෝෂය කළහ. එකාපිට මැරි වැටෙන්න ඒ ගම් වැසියන්ට වෙඩි තැබුවේ හමුදා හිලධාරීන් විසිනි. කටුනායක හලාවත ඝාතන කළේ කවුද? ප්‍රභාකරන්ගේ මිනියේ වැසූ මැස්සන් එළවූ හමුදා සෙබළුන්ට නායකත්වය දුන් අපේ හමුදා හිලධාරීන් යුද්ධය නිමවී එක් වසරක් යාමට පෙර නිරායුධ මිනිසුන් මරණ ඝාතකයන් කළේ කාගේ උවමනාවටද? සැකකාර රණවිරුවන් නමින් සන්ධ්‍යා එක්නැලිගොඩට තර්ජනය කළ අධිකරණයට අපහාස කළ බෞද්ධ භික්ෂූන්ගේද, හිලා වික්‍රමසිංහගේද මනස අවුල් කළ, ගිරුවාපත්තුවේ විෂම සංස්කෘතිය තවත් රටට අවශ්‍යද?

මහින්දට රට භාරදීමට කතා කරන වාසුලා දිනේෂ්ලා ගම්මන්පිලලා ඩිව්ලා තිස්ස විතාරණලා කතා කළ යුත්තේ ආර්ථිකය ගැන නොවේ. මහින්ද වැපුරූ මේ ඝාතනවාදී කුරිරු චින්තනය ගැනය. පරාදවූ මහින්ද මැදමුලනට මුදා හැරීම සාධාරණය. එහෙත් ඔහුට ආපසු හැරෙන්ට ඉඩදිය යුතු නැත. වයෝවෘද්ධ වාමාංශිකයන් මාක්ස් ලෙනින් පින්තූර ළඟ දන ගස්වා 18 සංශෝධනයට අත එසවූ එසේම අගවිනිසුරුවරිය පහ කිරීමට අත එසවූ හේතු විමසීමට අඳටත් පමා නැත. එසේ කළොත් මේ එකෙකු හෝ මහින්දට රට බාර දෙන්න නැවත සටන් කරන්නේ නැත.

Cartoon